ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය : www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

**නිකුත් කළේ** : බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව

**දිනය** : 2018 ජනවාරි 02

**ඊ. ටී. අයි ෆිනෑන්ස් ලිමිටඩ් හා ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පී.එල්.සී. ආයතනය සම්බන්ධව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගෙන ඇති නියාමන ක්‍රියාමාර්ග.**

ඊ. ටී. අයි ෆිනෑන්ස් ලිමිටඩ් හා ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පී.එල්.සී. යන ආයතන වල පවතින අසතුටුදායක මූල්‍ය කාර්යසාධන මට්ටම දීර්ඝ වශයෙන් සලකා බැලූ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2018.01.01 දින පැවති රැස්වීමේදී එම ආයතන දෙකෙහි තැන්පත්කරුවන්ගේ හා අනෙකුත් ණයහිමියන්ගේ හිමිකම් සුරක්ෂිත කිරීම සඳහාත් මූල්‍ය පද්ධතියේ සුරක්ෂිතතාවය හා ශක්තිමත්භාවය තහවුරු කර ගැනීම සඳහාත් කෙටිකාලීන පියවරක් ලෙස 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ ප්‍රතිපාදන යටතේ පහත ක්‍රියාමාර්ග වහාම ක්‍රියාත්මක වන පරිදි බලාත්මක කරන ලදී.

(1) අදාල ආයතන දෙකෙහි කළමනාකරණ කටයුතු කරගෙන යාම සඳහා මණ්ඩලයක් පත් කිරීම.

(2) කල්පිරෙන තැන්පතු ආපසුගැනීම සීමාකරමින් එම තැන්පතු මාස 06ක කාලයක් දක්වා දීර්ඝ කිරීම.

(3) තැන්පතු සඳහා ගෙවිය යුතු පොලිය එකඟ වූ කොන්දේසි වලට අනුව සිදුකිරීම.

මෙම කාලය අතරතුර අදාල ආයතනයන්ට ඔවුන් විසින් ආයෝජකයන් සමග පවත්වා ගෙන යනු ලබන සාකච්ඡා නිම කල හැකි අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අදාල නීති හා රෙගුලාසි වලට යටත්ව සුදුසු ආයෝජකයන් වෙත අවශ්‍ය පහසුකම් සපයනු ඇත.

මෙම ආයතන වල තැන්පතුකරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම පිණිස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එම ආයතන සම්බන්ධව තවදුරටත් ක්‍රියාමාර්ග ගනිමින් සිටින බව සහ එම ආයතන වල මෙහෙයුම් කටයුතු දැඩි ලෙස නිරීක්ෂණය කරන බව මෙම ආයතන දෙකෙහි තැන්පත්කරුවන් වෙත මෙමගින් තවදුරටත් දැනුම් දෙනු ලැබේ. එබැවින් ඊ. ටී. අයි ෆිනෑන්ස් ලිමිටඩ් හා ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පී.එල්.සී. යන ආයතන වල

ස්ථායිතාව තහවුරු කර ගැනීම පිනිස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගනු ලබන ක්‍රියාමාර්ග සඳහා සහයෝගය ලබා දෙන ලෙස එම ආයතන දෙකෙහි තැන්පත්කරුවන්ගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනු ලැබේ.

මේ සම්බන්ධව වැඩිදුර තොරතුරු ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ 0112 - 477258 හෝ 0112 – 477229 යන දුරකථන අංක මගින් තැන්පත්කරුවන්ට සම්බන්ධ විය හැක.